**Department of Disability Studies**
**FACULTY OF MEDICINE**
UNIVERSITY OF KELANIYA, SRI LANKA
**කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය**

களனி பல்கலைக்கழகம் - இலங்கை

---

**කථන සහ ශ්‍රවණ විද්‍යා, ගෞරව උපාධි පාඨමාලාව පිළිබඳ තොරතුරු බිඳක්.**

කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව (SHS) යනු දේශීය විශ්ව විද්‍යාලයක් හරහා පිරිනමනු ලබන එවැනි එකම අධ්‍යයන පාඨමාලාවයි.මෙම වැඩසටහනට ශ්‍රවණ විද්‍යාව සහ කථන සහ භාෂා චිකිත්සාව යනුවෙන් උපාධි වැඩසටහන් දෙකක් ඇතුළත් වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශය මගින් මෙය පවත්වනු ලබයි.මෙමඋපාධි වැඩසටහන් දෙකම ඉතා ඉහළ ඉල්ලුමක් ඇති අතර, විශාල පරාසයක විහිදුනු දේශන මාලාවක් සහ පුළුල් සායනික පුහුණුවක් ඇතුළත් වේ.එබැවින්, SHS පාඨමාලාවට ලියාපදිංචි වීම පිළිබඳ තීරණයක් ගැනීමට ඔබට උපකාර කිරීමේ අදහසින් පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

- SHS වැඩසටහන වසර 4ක පූර්ණ කාලීන ගෞරව උපාධි වැඩසටහනකි.
- පළමු අධ්‍යයන වාරය අවසානයේදී, සිසුන් ශ්‍රවණ විද්‍යාව හෝ කථන සහ භාෂා චිකිත්සාව යන වැඩසටහන් දෙකෙන් එකක් තෝරා ගැනීම අපේක්ෂා කෙරේ.
- ශ්‍රවණ විද්‍යාව විෂය ධාරාව තෝරා ගැනීමට සිසුන් උසස් පෙළ විභාගයේදී විෂයක් ලෙස භෞතික විද්‍යාව සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.
- කථන සහ භාෂා චිකිත්සක වැඩසටහන කායික විද්‍යාව , ස්නායු විද්‍යාව වැනි විද්‍යා විෂයයන් සහ වාග් විද්‍යාව සහ ආබාධිතතා අධ්‍යයනය වැනි කලා විෂයයන්ගේ එකතුවකි.එම නිසා කලා විෂය ධාරාව හැදෑරූ සිසුන් මූලික ජීව විද්‍යාවන් පිළිබඳ ඔවුන්ගේ දැනුම අලුත් කර ගත යුතු වේ. එසේම විද්‍යා විෂයයන් හැදෑරූ සිසුන් සිංහල හා දෙමළ භාෂාවේ ආකෘතිය හා ව්‍යාකරණ පිළිබඳ දැනුම වැඩි දියුණු කරගත යුතු වේ.
- ශ්‍රවණාබාධ, කථන/භාෂාව හෝ සන්නිවේදන අපහසුතා සහ පෝෂණය/ගිලීමේ අපහසුතා සහිත දරුවන් සහ වැඩිහිටියන් සමඟ වැඩ කිරීම මෙම පාඨමාලාවේ සායනික පුහුණුවට ඇතුළත් වේ.මෙයට ශ්‍රවණාබාධ සහිත දරුවන් හෝ වැඩිහිටියන්, ඔටිසම් තත්වය සහිත දරුවන්, ඉගෙනීමේ අපහසුතා, විදලිත තොල (Cleft Lip ), සින්ඩ්‍රොමික් (Syndromic)තත්ත්වයන් ඇතුළු බහුවිධ ආබාධ සහිත දරුවන් හා ආඝාතය වැළඳුනු වැඩිහිටියන් ද ඇතුළත් විය හැකිය.
- SHS පාඨමාලාව ගෞරව උපාධි වැඩසටහනක් වන බැවින්, සිසුන් තම අවසන් වසර තුළ පර්යේෂණ ව්‍යාපෘතියක් සහ නිබන්ධනයක් සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වේ. පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම

සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, සංඛ්‍යාන දැනුම සහ විද්‍යාත්මකව ලිවීමේ කුසලතාවය අනිවාර්‍ය වේ. පාඨමාලා අතරතුර මේවා පිළිබඳ පුහුණුව ලබා දෙනු ලැබේ.

- වෛද්‍ය පීඨය තුළ  ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි වේ.සියලුම දේශන, විද්‍යාගාර පදනම් කරගත් ප්‍රායෝගික පන්ති,  ඉගැන්වීම්, සායනික වාර්තා ලිවීම සහ සාකච්ඡා ඇතුලු සියලුම විධිමත් ඇගයීම් ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කෙරේ.පාසල් අධ්‍යාපනය තුළ ඔබට ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට විධිමත් අවස්ථාවක්  නොතිබුනේ නම්, පාඨමාලාව සාර්ථකව නිම කිරීම සඳහා පාඨමාලාව ඇරඹීමට පෙර අවශ්‍ය ඉංග්‍රීසි භාෂා නිපුණතාවයේ මට්ටම ලබා ගැනීමට, අමතර භාෂා සහාය ලබා ගත යුතු වේ.මීට අමතරව, පාඨමාලා කාලය පුරාවටම සිසුන් විශ්ව විද්‍යාලයේ පිරිනමන ඉංග්‍රීසි භාෂා පාඨමාලා අනුගමනය කිරීම සිදු කළ යුතුය. විශ්ව විද්‍යාලය විශේෂයෙන් පළමු සහ අවසාන වසරවල ඉංග්‍රීසි භාෂා සහාය ලබා දෙන අතර පිරිනමන භාෂා පාඨමාලා වලින්  උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සිසුන් සතු වගකීමක් වේ.
- මෙම පාඨමාලාවට, ආතතියට පත් නොවී සාර්ථකව මුහුණ දීමට උපකාර කිරීම සඳහා, අධ්‍යයන උපදේශකයින්/කථිකාචාර්‍යවරුන්ගේ සහය  සහ මනෝවිද්‍යාත්මක/උපදේශන සේවා වෛද්‍ය පීඨය තුළදී සපයනු ලබයි.
- මෙම උපාධි පාඨමාලාවේ ඉතිහාසය, දර්ශනය සහ පාඨමාලාව පිළිබඳ තොරතුරු හා ආබාධිතතා අධ්‍යයන අංශය හරහා සිදු කරන ලද දෑ පිළිබඳව අවබෝධයක් පහත ලින්ක් එක තුළින් පිවිසී ලබාගත හැකිය.

https://medicine.kln.ac.lk/depts/dds/